සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය 2021 (2022)

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

### ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| I | පත්‍රය | - | 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ |
| II | පත්‍රය | - | 1 ප්‍රශ්නය අනිවාර්ය වේ |
| | | - | 2,3,4,5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න 02ක් පමණයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| I | පත්‍රය | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | | | ලකුණු 40 |
| II | පත්‍රය | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 30 |
| II | පත්‍රය | - | එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I පත්‍රය | - | ලකුණු 40 |
| | | II පත්‍රය (I ප්‍රශ්නය) | - | ලකුණු 30 |
| | | 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |
| | | | | ලකුණු 100 |

# අ.පො.ස (සා.පෙළ) - 2021 (2022)
# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## *ආවරණය කෙරෙන ඉගෙනුම් පල*

## I පත්‍රය

01.

I. අ, ආ - • කුස ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

II. අ, ආ - • නන්ද මහතෙරුන් වහන්සේගේ කතා වස්තුවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි

III. අ, ආ - • තුංමංහන්දිය නවකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

IV අ, ආ - • නිර්දිෂ්ට පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියයි

V. අ, ආ - • පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.

02.

I. සිට V දක්වා

- ජාතක කතාවේ චරිත ලක්ෂණ ව්‍යුහගත කර දක්වයි
- ජාතක කතාවේ භාෂා ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි
- කුස ජාතකය රස විඳිමින් විචාරය කරයි.

**නැතහොත්**

02.

II. සිට V දක්වා

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි
- පද්‍ය නිර්මාණවල ධ්වනිත වන අදහස් ඉදිරිපත් කරයි.
- කාව්‍යමය උපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

## II පත්‍රය

01. (අ) සිට (ඈ) දක්වා

- කාව්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කවිවල ගැබ් වූ අත්දැකීම් විස්තර කරයි.
- කවියා යොදා ගෙන ඇති කාව්‍යෝපක්‍රම පද්‍ය නිර්මාණ ඇසුරින් විස්තර කරයි.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙමින් විචාරය කරයි.

02.

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂ ලක්ෂණ නන්ද තෙරුන්වහන්සේගේ කතා වස්තුව ආශ්‍රයෙන් පැහැදිලි කරයි.
- කතා වස්තුවේ චරිත, අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- නන්ද තෙරුන්වහන්සේගේ කතා වස්තුව රස විඳිමින් විචාරය කරයි.

03.

- පද්‍ය නිර්මාණවල අරමුණු පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

04.

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම විස්තර කරයි
- වැලපීම කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාව රසාස්වාදය හා විචාරයේ යෙදෙයි.

05.

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ :** ප්‍රශ්න අංක 03

(i) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{3}{5}$

(03) එකතුව ➡ □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
VI. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "ඉදින් මූ උන් දිටුහු නම් එක දවසකුත් හොරදා පලා යන්නා හ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි 'මූ' යන්නෙන් අදහස් වන්නේ කවරෙක් පිළිබඳ ව ද?

(අ) සීලවතී බිසව/කුස කුමරාගේ මව/කුස රජතුමාගේ මව/ඔක්කාක රජතුමාගේ දේවිය

(ආ) පබවත/පබාවතී /ප්‍රභාවතී/පබාවතී කුමරිය/මද්‍ර රජුගේ දියණිය

(ii) "මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(අ) නන්ද තෙරුන් වහන්සේ/නන්ද තෙරණුවෝ

(ආ ) සද්ධර්මරත්නාවලිය

(iii) "මම නං කැමති ටෙක්නිකල් කොලීජියට යන්ඩ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය නම් කරන්න.

(අ ) සිරිසේන/රණතුංග ආරච්චිගේ සිරිසේන/ආර්.ඒ. සිරිසේන

(ආ) තුංමංහංදිය/තුංමංහංදිය නවකතාව

(iv) (iv) න පු රු කලට සත හට පැමිණෙන වෙහෙස
එ දු රු නො වෙයි කළ පව් පල දෙවා මිස
තඹු රු වනය මුකුළිත වන බව සවස
ක වු රු විසින් වැළකිය හැකි මෙ දිය කුස

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(අ ) නරක කාලයට සත්ත්වයාට දුක් කරදර පැමිණෙන විට, කරන ලද පව්වලට විපාක ලබා දී මිස ඒ (දුක් කරදර) දුරු නො වේ.
මේ අදහස ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කළ යුතු ය.

(ආ) තඹුරු - නෙලුම්/පියුම්/සියපත්

(නෙලුම් මල් හැඳින්වීමට යොදන මෙයට සමාන වෙනත් පද වුව ද පිළිතුර ලෙස ඉදිරිපත් කර තිබේ නම් නිවැරදි ය.)

මුකුළිත - පරවුණු/මැලවුණු/ඇකිලුණු /හැකිලුණු

(v) පෙරදිග ගොරහැඩි රකුසෝ,
මගේ ධාන්‍යය ඇයි කඩන්නේ
හිඳා ගන්න පොරොවගත්ත
කලු ලෙදී පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නේ.

(අ) 'පෙරදිග ගොරහැඩි රකුසෝ, මගේ ධාන්‍යය ඇයි කඩන්නේ' යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(v)

(අ ) උදෑසන හිරු නැඟ ඒමත් / හිරු උදාවත් සමග කවියාගේ නිඳි සුව බිඳී යාම නිසා සිතෙහි හට ගත් අකමැත්ත ප්‍රකාශ කිරීම
මෙම අදහස ඇතුළත් වනසේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

(ආ ) සිරි ගුනසිංහ /සිරි ගුනසිංහ මහතා/ සිරි ගුනසිංහ කවියා

*(ලකුණු 04 x 5 = 20යි)*

(02)

(i) කුස රජ පබාවතිය කෙරෙහි පැවති තදබල ප්‍රේමය පිළිබිඹු වන අවස්ථා **දෙකක්** මෙම ඡේදය ඇසුරෙන් ලියන්න.

- පබාවතියගේ කෝපය /අකමැත්ත දුරු වන තුරු මදු රජුගේ මාළිගයෙහි දුක් විඳිමින් අරක්කැමියෙකු ලෙස වාසය කිරීම
- පබාවතියගෙන් ලැබෙන සිනහවක් /සෞම්‍ය බැල්මක් වෙනුවෙන් බලා සිටීම
- දිවුල් ලාටුවෙහි ඇලුණු වානරයෙකු සේ පබාවතිය කෙරෙහි බැඳුණු සිතින් පසු වීම
- පබාවතිය උපායක් යොදා කුස රජතුමා අධෛර්ය කිරීමට උත්සාහ කළ ද එම උපායට හසු නො වී පබාවතිය කෙරෙහි තදබල ඇල්මෙන් පසු වීම

මෙම අදහස්වලින් කරුණු දෙකක් පිළිතුරට ඇතුළත් විය යුතු ය.

*(ලකුණු 04යි)*

(ii) මෙම උද්ධෘතයට අනුව කුස රජ අධෛර්ය කිරීමට පබාවතිය යෙදූ උපක්‍රමය කුමක් ද?

තමා නිමිත්ත පාඨකයන්ගෙන්/නිමිති කියන අයගෙන්, කුස රජු තමාගේ ස්වාමියා වන්නේදැයි විමසූ විට "ඔබ සත්කඩකට කැපූවත් කුස රජුගේ අග මෙහෙසිය නො වන බව" එම නිමිති කියන අය විසින් පවසන ලද බව පබාවතිය කුස රජුට පැවසීම

මෙම අදහස ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් වී තිබිය යුතු ය.

*(ලකුණු 04යි)*

(iii) පබාවතියගේ උපායට කුස රජ යෙදූ ප්‍රතිඋපාය කුමක් ද?

තමා ද නිමිත්ත පාඨකයන්ගෙන්/නිමිති කියන අයගෙන් විමසූ බවත් එවිට "ඔබ හැර ඇයට (පබාවතියට) ස්වාමියා වන වෙන කෙනෙක්/සුදුසු අන් කෙනෙක් නැති බව" එම නිමිති කියන අය පැවසූ බවත් කුස රජු පබාවතියට පැවසීම

(ලකුණු 06යි)

(iv) මෙම උද්ධෘතයට අනුව කුස රජතුමාගේ යාඥාව කෙරෙහි පබාවතිය දැක් වූ අවසන් ප්‍රතිචාරය කුමක් ද?

කුස රජතුමා කිසිම ආකාරයකින් අධෛර්යය කළ නොහැකි බැවින් /ලැජ්ජාවට පත් කළ නොහැකි බැවින් මාළිගය හැර ගිය ද නොගිය ද තමාට කමක් නැතැයි සිතා තමන්ගේ යහන් ගැබට වැදී දොර වසා ගැනීම

මෙම අදහස ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

(ලකුණු 06යි)

(ඉහත i ,ii ,iii , iv ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අදාළ උද්ධෘත ඡේදයෙන් උපුටා දක්වා තිබුණ ද නිවැරදි පිළිතුරක් සේ සලකා ලකුණු පිරිනමන්න.)

**නැතහොත්**

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසයැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර?

(i) මිතුරා හමුවීමට පැමිණි කවියාට ලැබුණු ප්‍රතිචාරය කෙබඳු ද?

- මිතුරාගෙන් වෙනදා මෙන් සුහද සිනහවෙන් හෝ කතාවෙන් හෝ ප්‍රතිචාරයක් නොලැබීම
  උදා:- "එසඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නැසේ මට"
- මිතුරා නිහඬවත් උඩඟු ස්වභාවයෙනුත් කථකයා නොහඳුනන ලෙස පසුවීම
  උදා:- "මේසය මත ලිපිගොනු රැස..."

මේ අදහස් ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

(ලකුණු 04යි)

(ii) කවියේ ඇතුළත් උපමාවක් උපුටා ලියන්න.

- "මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින ඒ මත හිඳිනා ගල සේ"/
  "ඒ මත හිඳිනා ගල සේ "

*(ලකුණු 04යි)*

(iii) කවියේ සඳහන් පරිදි දිසාපති කාමරයේ දී හමු වූ මිතුරාගේ චරිත ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න.

- තම තත්ත්වය නිසා උඩගු වූ/හිස උදුම්මවා ගත් ස්වභාවය
  උදා :- "එසඳ ඔබේ මුවග නැඟුණ..."
- ආඩම්බර/උඩගු තැනැත්තෙකු බව
  උදා :- "ඒ මත හිඳිනා.... "
- තම අතීතය අමතක කර කටයුතු කරන පුද්ගලයෙකුගේ ස්වභාවය/මුල අමතක කළ පුද්ගලයෙකුගේ ස්වභාවය

  උදා :- "බාලේ අපි ගම්දොර"

  " මහදේ ඇඳී ඔබෙ සිතුවම..."

*(ලකුණු 06යි)*

(iv) කවියේ සජීවී ගුණය සඳහා එහි භාෂාව ඉවහල් වී ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

- කටවහරට සමීප සරල බස්වහරක් යොදා ගෙන තිබීම නිසා කවියේ සජීවී බව ආරක්ෂා වී ඇත.
  උදා :

  "දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු..."
  "බාලෙ අපි ගම්දොර..."

- උපමා ආදී කාව්‍යාලංකාර උචිත පරිදි යොදා ගෙන ඇත.
  උදා :

  "ඒ මත හිඳිනා ගල සේ..."

- සංකල්ප රූප මැවෙන ආකාරයෙන් භාෂාව හසුරුවා ඇත.
  උදා :
  "බමන විදුලි පංකාවෙන්..."
  "බිත්තියෙ ඇති සේයා රූ..."

- වියත් වහර යෙදීම
  උදා:-

  සාද තෙපුල්, සරතස, සුමිතුර, කෙළිමඬුලු

මෙවැනි යෝග්‍ය උදාහරණ සහිත ව පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

*(ලකුණු 06යි)*

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන, වචන 200කින් පමණ රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි ඒ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ තින්දෙ ම පත් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුනුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පටිවල් බැඳ කපනු ඉරනු වැන්නේ
නෙදයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(අ) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම

- දැව ජාවාරම්කරුවන් විසින් වනාන්තරයේ ගස් කපමින් සිදු කරන ලද පරිසර විනාශය පිළිබඳ අද්දැකීමක් මෙම පද්‍ය පන්තියට පාදක වී ඇත.
- එහි ප්‍රතිඵලයක් ලෙස අවසානයේ කාන්තාර ගමක් බිහි වන ආකාරය කවියා මෙම නිර්මාණයෙන් ඉදිරිපත් කරයි.

උදා :

"ගොඩේ කන්ද මූකලාන..."
"මූකලාන පස්වැටියක් වී..."
" පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා"
"පොරොව, කියත කළුවරේ ම..."
"කාන්තාර ගම මායිම්... "

පැදිපෙළට පාදක වූ අද්දැකීම, මෙම අදහස් ඇතුළත් වන සේ සුදුසු උදාහරණ දක්වමින් ඉදිරිපත් කර තිබිය යුතු ය.

- *අත්දැකීම විස්තර කර ඇත්නම් ලකුණු 04යි.*
- *උදාහරණය ලබා දී ඇත්නම් ලකුණු 02යි.*
- *(ලකුණු 04 +02 = 06යි)*

(ආ) එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා හා ඇතුළත් කළ යුතු ව ඇත.

'කාන්තාර ගමක උපත' පද්‍ය පන්තියට පාදක වූ අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා විවිධ සිද්ධි හා අවස්ථා යොදා ගෙන ඇත.

- ගොඩේ කන්ද මූකලානේ රූස්ස ගස් කපා බිම හෙළන ආකාරය;

  උදා :

  "ගොඩේ කන්ද මූකලාන..."

  "යස දරුවන් ඇකයෙන් ගෙන..."

  "පොරොව, කියත කලුවරේ ම..."

- මෙම පරිසර විනාශය දකිමින් කථකයා කම්පා වන ආකාරය;
  උදා :
  "අඩ නින්දේ පන් පැදුරට..."
  "මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ..."

- පරිසරය අකම්පිත ව/නොසැලී මෙම විනාශය දෙස බලා සිටින ආකාරය;
  උදා : "සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
  මහා පුරුෂයෙකු වාගේ කන්ද නැගී ඉන්නේ "

- ප්‍රබල ජාවාරම්කරුවන්ට නීතියේ රැකවරණය ලැබෙද්දී දුබලයාට එරෙහි ව නීතිය ක්‍රියාත්මක වන ආකාරය;
  උදා : "පිරුණු ලොරිය..."
  "පරාල තුනකට අයියා...

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 03යි.***
  ***(ලකුණු 03 +03 = 06යි)***

(ඉ) මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය

මෙම පද්‍ය පන්තියට පාදක වූ අත්දැකීම ප්‍රතිනිර්මාණයට උචිත ලෙස කවියේ භාෂාව යොදා ගැනීමට කවියා උත්සාහ ගෙන ඇත. එය කවියේ සාර්ථක බවට හේතු වී ඇත.

- ගැමි වහර
  ගොඩේකන්ද මූකලානේ සිදුවන පරිසර විනාශයක් පිළිබඳ එම ප්‍රදේශයේ ම වෙසෙන පුද්ගලයෙකු කථකයා ලෙස යොදා ගෙන මෙම කවි පන්තිය නිර්මාණය කර ඇති අතර, එහි දී ගැමි වහර යොදා ගැනීම කවියේ සාර්ථක බවට හේතු වී ඇත.

උදා :

" ගොඩේ කන්ද", "මූකලාන", " පන් පැදුර" , "හුහුංලනවා", "පට්ටල්"

- සරල බස්වහර
  කවියට පාදක වූ අත්දැකීම ප්‍රතිනිර්මාණයට උචිත ලෙස සරල බස් වහරක් යොදා ගැනීමට කවියා උත්සාහ ගෙන ඇත.

උදා :

"අඩ නින්දට..", "උණු කඳුළක්", "පස් වැටිය...", "දුක් කරදර ", "ඇද හැලිලා"

- ව්‍යංග්‍යාර්ථවත් බස් වහර
  ව්‍යංග්‍යාර්ථවත් බස් වහර හා යෙදුම් උචිත ලෙස යොදා ගැනීම පද්‍ය පන්තියේ සාර්ථක බවට හේතු වී ඇත.

උදා:

"පිරුණු ලොරිය..."
"පරාල තුනකට අයියා... "
" පොරව කියත කලුවරේම... "
" පාර වුණත් හිරිහැරයක් නෑ... "

- සිදු වීමට නියමිත මහා වන විනාශය කවියා කල් ඇතිව දුටු බව
  "මූකලාන පස් වැටියක් වී..."
- සිදු වන වනාන්තර විනාශය ගැන කවියා කම්පා වන බව

  "අඩ තිත්දෙම පත් පැදුරට උණු කඳුලක්..."
  "මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ..."

- දැව ජාවාරම්කරුවන්ට නීතියේ ආරක්ෂාව ලැබෙන බව/ඔවුන්ට එරෙහි ව නීතිය ක්‍රියාත්මක නො වන බව

  " පිරුණු ලොරිය..."
  "දෙයියංගේ මල්ලිලාට ..."

- දිළිඳු/දුබල ගැමියන්ට එරෙහි ව අසාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක වන බව

  "පරාල දෙකකට අයියා..."

**මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.**

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 03යි.***
  ***(ලකුණු 03 +03 = 06යි)***

**(ඊ) මෙම පද්‍ය නිර්මාණයේ භාවිත ආකෘතිය**

- මෙම පද්‍ය නිර්මාණය සඳහා යොදා ගෙන ඇත්තේ සිවුපද ආකෘතියයි.

- සෑම පද්‍ය පාදයක් ම අවසානයේ සමාන අක්ෂරයකින්/ශබ්දයකින් අවසන් වන සේ එළිවැට යොදමින් කවි පෙළ නිර්මාණය කර ඇත.

  උදා : පද්‍ය පන්තියේ සුදුසු කවිවලින් උදාහරණ ඉදිරිපත් කළ යුතු ය.

- මෙම ආකෘතිය හේතුවෙන් පද්‍ය පන්තියට සුගායනීය රිද්මයක් ලැබී ඇත.
- එය කවි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇත.

**මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.**

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 03යි.***
  ***(ලකුණු 03 +03 = 06යි)***

**(උ) සමාජයේ පවතින ඇතැම් අකටයුතු කෙරෙහි කවියා දක්වන විරෝධය**

- වන විනාශය ද ඇතුළු ව සමාජයේ සිදු වන ඇතැම් අකටයුතු කෙරෙහි දක්වන විරෝධය "කාන්තාර ගමක උපත" පද්‍ය පන්තියෙහි නිරූපිත ය .

- රාත්‍රී කාලයේ දී රහසිගත ව වනාන්තරයේ ගස් කපා දමන ආකාරය කවියාගේ විරෝධයට ලක් වේ.
  උදා : "රුස්සයෙකි ඵ පාළුව බිඳගෙන..."

- වනයෙන් කපන ලද දැව පුරවා ගත් ලොරි රථ නිරූපද්‍රිත ව ගම මැදින් ගමන් කරන ආකාරයත් ඒවා නීතියේ රැහැනට හසු නො වන ආකාරයත් කවියා විරෝධාකල්ප දනවමින් නිරූපණය කරයි.
  උදා : " පිරුණු ලොරිය ගම් දොරකඩ ..."
  "පාර වුණත් හිරිහැරයක් නෑ..."

- අයථා අන්දමින් බලය ගොඩනගා ගත් දැව ජාවාරම්කරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නො වී, දිළිඳු ගැමි පුද්ගලයන්ට එරෙහි ව නීතිය අසාධාරණ ලෙස ක්‍රියාත්මක වීම පිළිබඳ කවියා තම විරෝධය පළ කරයි.
  උදා :

  "පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා..."

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 03යි.***
  ***(ලකුණු 03 +03 = 06යි)***

***(ලකුණු 06 x 5 = 30යි)***

**2.** සජීවී අවස්ථා නිරූපණයෙහි ලා සද්ධර්මරත්නාවලී කතුවරයා සතු හැකියාව නන්ද තෙරුන් වහන්සේගේ වස්තුවෙන් උදාහරණ **තුනක්වත්** සපයමින් පහදන්න.

සජීවී ලෙස අවස්ථා නිරූපණයෙහි ලා සද්ධර්මරත්නාවලී කතුවරයා දැක්වූ කුසලතාව නන්ද තෙරුන් වහන්සේගේ කතාවස්තුවෙන් මැනවින් නිරූපිත ය. එවැනි අවස්ථා කිහිපයක් අදාළ කතා වස්තුවෙන් හඳුනාගත හැකි ය.

- බුදුන්වහන්සේ කිඹුල්වත් නුවරට වැඩ දන් වළඳා පාත්‍රය නන්ද කුමරු අතට දී නිග්‍රෝධාරාමයට වඩින අවස්ථාවේ සෙසු පිරිස් ගොස් නන්ද කුමරුන් බුදුන්වහන්සේ විසින් කැඳවාගෙන යනු ලබන බව ජනපද කල්‍යාණියට පවසති. එබස් ඇසූ ජනපද කල්‍යාණිය හිස සෝදමින් සිට සෝධා නොනිමි හිස කෙස් නොබැඳ පැමිණි අවස්ථාව.

  උදා :- "ගියත් සුළුගෙයි වහා එවයි කිවූ ය. "

- රහල් කුමරුන් මහණ වූ බව දැනගත් සුද්ධෝදන රජතුමා විසින් බුදුන්වහන්සේට දරුවන් මහණ කරවීමට පෙර දෙමාපියන්ගේ අනුමැතිය ගත යුතු බව පැවසූ අවස්ථාව;

  උදා:- "දරුපෙම් මුනුබුරු පෙම් ඇත්තේ මට මතු නො වන්නේවේ ද? කාටත් සරි ය."

- බුදුන්වහන්සේ නන්ද කුමරුන් සමග තව්තිසා දෙව්ලොවට වඩින අවස්ථාවේ අතරමග නවදැලි හේනක් මවා හේනේ දා වක ගැසී ගිය වැඳිරි මැහැල්ලක මවාලා තව්තිසා දෙව්ලොවට වැඩ සක්දෙව්ඳුගේ පන්සියයක් පමණ දෙවඟනන් පෙන්වා රූපයෙන් වඩාත් ලස්සන ජනපද කල්‍යාණිය ද දෙවඟනන් ද යනුවෙන් විමසූ අවස්ථාව;

  උදා:-"ස්වාමීනී කුමක් වදාරන සේක් ද මේ දෙවඟනන් දුටු කලට දනව් කලණ බිසව් නම් අතුරු මග නවදැලි සේනේ අප දුටු දා වක ගැසී ගිය වැඳිරිමැල්ලත් වටිත්දැ'යි කී සේක."

- බරණැස් නුවර කප්පට වෙළෙන්දා සමග වෙළඳාම් සඳහා ගිය කොටළුවා තණකොළ කෑම සඳහා නිදහස් කළ අවස්ථාවේ කොටළු දෙනක දැක ඇය ළඟට ගොස් කතා බහ කළ අවස්ථාව;

  උදා:-"මෙතෙක් බර උසුලාගෙන දවස කොතෙක් තැන් යව්දැයි විචාලී ය . 'අටවිසි ගව්වක් විතර යෙමි' යි කී කල්හි... ගිය තැන ගමන් ඇවිදින පය මිරිකන කෙනෙක් ඇද්ද, නැද්දැ' යි විමසුවා ය.

- **අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)**
- **එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)**
- **භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.**
- **නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.**
- **(ලකුණු 06 +06+02+01 = 15යි)** **(ලකුණු 15යි)**

**3.** දේශාභිමානී හැඟීම් දැනවීම සඳහා උචිත ලෙස බස හැසිරවීමට 'පුතු ඉපදුණු මේ දෙරණේ' පද්‍ය නිර්මාණයේ රචකයා දැක් වූ සමත්කම නිදසුන් **තුනක්වත්** දෙමින් විමසන්න.

දේශාභිමානී හැඟීම් දැනවීම සඳහා උචිත ලෙස බස හැසිරවීමට "පුතු ඉපදුණු මේ දෙරණේ" පද්‍ය නිර්මාණයේ රචකයා සමත් වී ඇත.

- අතීතයේ වීර දූපුතුන් පිළිබඳ ස්මරණය කරමින් දේශාභිමානි හැඟීම් පුබුදු කරවන සේ බස හසුරුවා ඇත.

  උදා:- "විහාර මහ මැණිවරුන්
  ඉපදුණු පොළොවයි
  මද්දුම බණ්ඩාර පුතුන්
  ඉපදුණු පොළොවයි... "

- අපේ සංස්කෘතික උරුමයන් හා මහපොළොවෙන් පුතුට උරුම වන අම්ල සම්පත් පිළිබඳ ව දේශාභිමානය දැනවෙන ආකාරයට පද්‍ය පන්තිය නිර්මාණය කර තිබේ.

  උදා:- " මහා සෑ රන් කොත මුදුනේ ..."
  " සිරිමා බෝ මැඩ සෙවණේ ..."
  "දළදා හිමි රැඳි විමනේ..."
  "සතර අතින් මුහුද නැඟී..."
  "වෙරළ දිගින් මුතු මතු වී ..."

- යෝග්‍ය පරිදි සරල බස් වහර හා වියත් බස් වහර භාවිත කර ඇත.

  උදා:- "මද්දුම බණ්ඩාර පුතුන්
  ඉපදුණු පොළොවයි ..."
  "ඒ පොළොවේ ඔද තෙද ගුණ..."
  "යසස උදාවෙයි ..."

- පද්‍ය පන්තියේ රසය කුළු ගැන්වෙන ලෙස කාව්‍යාත්මක යෙදුම් භාවිත ගෙන ඇත.

  උදා:- "වෙරළ දිගින් මුතු මතු වී
  යසස උදාවෙයි..."

  " පොළොව පලා මිණි රුවනින්
  ඉසුරු ගලා එයි..."

- **අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)**
- **එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)**
- **භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.**
- **නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.**
- **(ලකුණු 06 +06+02+01 = 15යි)**

**(ලකුණු 15යි)**

**4.** "තම පුතුගේ වියෝව හේතුවෙන් වේදනාවට පත් වූ පියෙකුගේ චරිතය 'වැලපීම' කෙටිකතාවෙන් නිරූපණය වේ." නිදසුන් **තුනක්වත්** ඇසුරින් පහදන්න.

පුතුගේ වියෝව නිසා වේදනාවට පත් පියෙකුගේ චරිතයක් වැලපීම කෙටිකතාවේ ඉයෝනාගේ චරිතයෙන් නිරූපණය වේ.

- ඉයෝනාගේ දුක්ඛිත ස්වභාවය ඔහුගේ හැසිරීමෙන් ප්‍රකට කර තිබීම;

උදා:- ''ඔහු ඉන්නේ හිම කන්දක් තමා වෙත කඩා වැටුණත් ඉන් ගැලවීමට උවමනාවක් නැත්තෙකු ලෙසිනි. ''
''යුද්ධ නිලධාරියා තම රථයට නැංවා ගත් පසු ඉයෝනා ගමන පිටත් වන්නේ නිශ්චිත අදහසකින් තොර ව ය''
''ඉයෝනා නිලධාරියා දෙසට හැරී තොල් මතුරයි ... එහෙත් ඔහුට පිට කළ හැකි වූයේ සුසුමක් පමණි... ''

- ඉයෝනා තම දුක පැවසීමට දරන උත්සාහය නිරූපණය කිරීම;

උදා:- '' හමුදා නිලධාරියාට ඉයෝනා විරිත්තමින් සිනා සී අමාරුවෙන් රළු හඬකින් කතා කරයි.''
''මගේ පුතා මැරුණා. මම තාම පණ පිටින්. එහෙම පුදුම දෙයක්... මා ළඟට එනවා වෙනුවට ඌ පුතා ළඟට ගියා...''

- ඉයෝනා තම පුතුගේ වියෝව විවිධ පුද්ගලයින් හමුවේ ප්‍රකාශ කර අස්වැසිල්ලක් නොලැබුණු විට අවසානයේ තමාගේ අශ්වයාට දුක පවසා සිත සනසා ගැනීම;

උදා:- '' දැන් ඉතින් කුෂ්මා ඉයොනිච් ඉවරයි... ඒක දුකයි නොවෙද බොල ...''

- මේ ආකාරයෙන් සමකාලීන සමාජයේ පැවති දරිද්‍රතාව, පන්ති විෂමතාව, නූගත්කම, නීති රීතිවල අඩු ලුහුඬුකම් යනාදි හේතු ඉයෝනාගේ දුක්ඛිත ඉරණමට හේතු වී ඇති ආකාරය 'වැලපීම' කෙටිකතාවෙන් නිරූපිත ය.
- ***අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)***
- ***එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)***
- ***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.***
- ***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.***
- ***(ලකුණු 06 +06+02+01 = 15යි)***

***(ලකුණු 15යි)***

5. ''මහින්ද හිමියෝ, 'යුතුකම' පද්‍ය පන්තියෙන් සමකාලීන සමාජය තියුණු විචාරයට ලක් කරති.'' නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න.

මහින්ද හිමියෝ, "යුතුකම" පද්‍ය පන්තියෙන් සමකාලීන සමාජය තියුණු විචාරයට ලක් කරති.

- අධිරාජ්‍යවාදීන්ට ගැති ව සිටි තත්කාලීන සාමාජය ඉන් මුදවා ගෙන ස්වාධීන ජාතියක් ලෙස නැගී සිටීමට දිරි දීම, යුතුකම පද්‍ය පන්තියෙන් කතුහිමියෝ අපේක්ෂා කළහ.

උදා :-

"උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ...."

"ලොම් සිදුරක තරම් වත් අඩ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා"

"උපන් ගමේ බල උරුමය රැක ගන්ට..."

- ඇතැම් අවස්ථාවල දී ආවේගශීලී බස්වහරක් යොදා ගනිමින් තම අධිරාජ්‍ය විරෝධී අදහස් සහෘද මනසට සමීප කරවීමට කතුහිමියන් උත්සාහ ගෙන ඇත.

"අතත් පයත් ඔළුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නෑ බියසුලු ගතිය එපා...."

- ශ්‍රී ලාංකේය ජනතාව ස්වාධීන ජාතියක් වශයෙන් නඟා සිටුවීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දීමට ද කවියා මෙහි දී උත්සුක වී ඇත.

" වඳින්නේ නැති ව ලොකු නිලධාරීන් ට"
" අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා"
"නිලධාරීන්ට විශ්වාසය දෙන්ට එපා"

- *අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
- *එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
- *භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
- *නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
- *(ලකුණු 06 +06+02+01 = 15යි)*

*(ලකුණු 15යි)*